සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ட்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2017**

| | |
|---|---|
| ගිණුම්කරණය | I |
| கணக்கீடு | I |
| Accounting | I |

**33 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.
- **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

**විභාග අංකය :** ....................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**1.** ආයතනයක මූල්‍ය ගිණුම්කරණයෙහි මූලික අරමුණ කුමක් ද?
(1) තීරණ ගැනීමට කළමනාකරුවන්ට තොරතුරු සැපයීම
(2) ආදායම මත බදු අය කිරීම සඳහා රජයට තොරතුරු සැපයීම
(3) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් පළ කිරීම සඳහා විගණකවරුන්ට තොරතුරු සැපයීම
(4) මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වීම අධීක්ෂණය කිරීමට තොරතුරු සැපයීම
(5) ආයතනය පිළිබඳව ඇල්මක් දක්වන බාහිර පාර්ශ්වවලට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම (......)

**2.** සේවකයන්ගේ නිපුණතා ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවල හඳුනා **නොගැනීමට** පදනම් වනුයේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
(1) ඒකක (2) විචක්ෂණ (3) ඓතිහාසික පිරිවැය (4) ප්‍රමාණාත්මක (5) මූල්‍ය මිනුම් (......)

**3.** ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියෝ සහ ණයහිමියෝ හඳුනාගැනීමට පදනම් වනුයේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
(1) උපචිත (2) විචක්ෂණ (3) අඛණ්ඩ පැවැත්ම (4) ගැළපුම් (5) ප්‍රමාණාත්මක (......)

**4.** නුවන්ගේ ව්‍යාපාරය විසින් ලබාගත් ණය මුදලෙහි මාසික වාරිකය වූ රු. 100 000, නුවන් විසින් තම පෞද්ගලික මුදලින් ගෙවන ලදී. වාරිකය තුළ අන්තර්ගත වූ පොලිය රු. 25 000 කි. පහත කුමන ගිණුම්කරණ සමීකරණය මෙම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** දක්වනු ලබයි ද? (මූල්‍ය ප්‍රකාශන මාසිකව පිළියෙල කර ඇති බව උපකල්පනය කරන්න.)

| | වත්කම් (රු.) | = | වගකීම් (රු.) | + | හිමිකම් (රු.) |
|---|---|---|---|---|---|
| (1) | 0 | | –75 000 | | +75 000 |
| (2) | 0 | | –100 000 | | +100 000 |
| (3) | +75 000 | | 0 | | +75 000 |
| (4) | –100 000 | | –100 000 | | 0 |
| (5) | –100 000 | | –75 000 | | –25 000 |

(......)

- **ප්‍රශ්න අංක 5, 6 සහ 7 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ලැයිස්තුගත මිල රු. 100 000 ක් වූ භාණ්ඩ 2017.03.10 දින කුමාර විසින් අමල්ට 10% ක වෙළෙඳ වට්ටමක් අඩු කිරීමෙන් පසුව ණයට විකුණන ලදී. මෙම භාණ්ඩවල පිරිවැය රු. 60 000 කි. අමල් විකුණුම් මිල රු. 30 000 ක් (පිරිවැය රු. 20 000 කි) වූ භාණ්ඩ 2017.03.15 දින ආපසු එවන ලදී. 5% ක මුදල් වට්ටමක් ලැබීමෙන් පසු 2017.03.31 දින අමල් ගෙවිය යුතු ශේෂය පියවන ලදී.

**5.** මෙම ගනුදෙනු **කුමාරගේ** ව්‍යාපාරයේ සටහන් කිරීමට යොදා ගනු ලබන මූලික ලියවිලි අනුපිළිවෙළින්:
(1) ඉන්වොයිසිය, හරපත, ලදුපත (2) ඉන්වොයිසිය, බැරපත, ලදුපත
(3) ඉන්වොයිසිය, ජර්නල් වවුචරය, ලදුපත (4) ඉන්වොයිසිය, හරපත, ජර්නල් වවුචරය
(5) ඉන්වොයිසිය, බැරපත, ජර්නල් වවුචරය (......)

**6.** මෙම ගනුදෙනු හේතුවෙන් 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **කුමාරගේ** ව්‍යාපාරයෙහි ශුද්ධ ලාභයෙහි **ශුද්ධ වැඩි වීම:**
(1) රු. 6 500 (2) රු. 7 000 (3) රු. 17 000 (4) රු. 20 000 (5) රු. 26 500 (......)

**7.** මෙම ගනුදෙනු **අමල්ගේ** ව්‍යාපාරයෙහි සටහන් කිරීමට භාවිත කරන මූලික සටහන් පොත් අනුපිළිවෙළින්:
(1) ගැනුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(2) ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(3) ගැනුම් ජර්නලය, ගැනුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(4) ගැනුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, පොදු ජර්නලය
(5) ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, පොදු ජර්නලය (......)

[දෙවැනි පිටුව බලන්න.

**8.** පහත තොරතුරු ව්‍යාපාරයක පොත්වලින් උපුටා ගන්නා ලදී.

| | 2017.03.31 දිනට (රු.) | 2016.03.31 දිනට (රු.) |
|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 1 200 000 | 1 000 000 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම | 120 000 | 100 000 |

තව ද 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී රු. 60 000 ක් බොල් ණය ලෙස කපා හැර එය බොල් ණය ගිණුමේ වාර්තා කර ඇත.

පහත කුමක් **නිවැරදි** වේ ද?

| | 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බොල් සහ අඩමාන ණය වියදම (රු.'000) | 2017.03.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑහි ධාරණ වටිනාකම (රු.'000) |
|---|---|---|
| (1) | 60 | 1 080 |
| (2) | 80 | 1 020 |
| (3) | 80 | 1 080 |
| (4) | 180 | 1 020 |
| (5) | 180 | 1 080 |

(……)

● **ප්‍රශ්න අංක 9 සහ 10 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ව්‍යාපාරයක් බැංකු ජංගම ගිණුමක් ආශ්‍රයෙන් එහි සියලු මුදල් ගනුදෙනු සිදුකරනු ලබයි.

ගිණුම් පොත්වලට අනුව 2017 මාර්තු මාසය සඳහා මුදල් ගනුදෙනුවල සාරාංශය:

| විස්තරය | රු.'000 |
|---|---|
| 2017.03.01 දිනට මුදල් ශේෂය | 100 |
| 2017.03.31 දිනට මුදල් ලැබීම් ජර්නලයේ එකතුව | 1 200 |
| 2017.03.31 දිනට මුදල් ගෙවීම් ජර්නලයේ එකතුව | 900 |

2017.04.04 දින ලද 2017 මාර්තු මාසය සඳහා බැංකු ප්‍රකාශනයේ සාරාංශය:

| විස්තරය | රු.'000 |
|---|---|
| 2017.03.01 දිනට ශේෂය | 100 |
| උපලබ්ධි වූ චෙක්පත් | 1 000 |
| ගෙවන ලද චෙක්පත් | 750 |
| සෘජුව බැරකරන ලද ස්ථාවර තැන්පත් පොලිය | 200 |
| ස්ථාවර නියෝග ගෙවීම් | 50 |

ස්ථාවර තැන්පත් පොලිය සහ ස්ථාවර නියෝග ගෙවීම් පොත්වල සටහන් කරනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව ය. 2017.03.01 දිනට උපලබ්ධි නොවූ හෝ ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් කිසිවක් නොවී ය.

**9.** 2017.03.31 දිනට ව්‍යාපාරයේ මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය කොපමණ ද?

(1) රු. 300 000 (2) රු. 350 000 (3) රු. 400 000 (4) රු. 500 000 (5) රු. 550 000 (……)

**10.** 2017 මාර්තු මාසය සඳහා මෙම ව්‍යාපාරයේ මුදල් ගනුදෙනු සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - 2017 මාර්තු මාසය සඳහා මුළු මුදල් ලැබීම් රු. 1 400 000 ක් විය.

B - 2017 මාර්තු මාසය සඳහා මුළු මුදල් ගෙවීම් රු. 950 000 ක් විය.

C - 2017.03.31 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් රු. 200 000 ක් විය.

D - 2017.03.31 දිනට ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 150 000 ක් විය.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා D පමණි.
(4) C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ල ම ය. (……)

**11.** ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වා ගනු නොලබන ව්‍යාපාර ඒකකයකට අදාළ ව පහත තොරතුරු ලබා දී ඇත.

| විස්තරය | 2017.03.31 දිනට (රු.'000) | 2016.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| ප්‍රාග්ධනය | 650 | 500 |
| රඳවාගත් ඉපැයුම් | 325 | 250 |

අයිතිකරු වාර්ෂිකව රු. 50 000 ක මුදලක් පෞද්ගලික භාවිතය සඳහා ව්‍යාපාරයෙන් ලබා ගනී. මෙම මුදල ව්‍යාපාරය විසින් පවත්වා ගනු ලබන එක ම සංචිතය වන රඳවාගත් ඉපැයීම්වලට හර කර ඇත.

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ 2017.03.31 දිනට ශුද්ධ වත්කම් කොපමණ ද?

| | වර්ෂය සඳහා ලාභය (රු.'000) | ශුද්ධ වත්කම් (රු.'000) |
|---|---|---|
| (1) | 25 | 925 |
| (2) | 75 | 975 |
| (3) | 75 | 875 |
| (4) | 125 | 875 |
| (5) | 125 | 975 |

(……)

[තුන්වැනි පිටුව බලන්න.

**12.** පාසල් සංවර්ධන සමිතියක වත්කම් සහ වගකීම් පහත පරිදි විය:

| **විස්තරය** | **2017.03.31 දිනට (රු.'000)** | **2016.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| කාර්යාල උපකරණ (ධාරණ වටිනාකම) | 750 | 800 |
| හිඟ සාමාජික මුදල් | 10 | 20 |
| බැංකුවේ ඇති මුදල් | 80 | 80 |
| දිගුකාලීන බැංකු ණය | 600 | 800 |
| කලින් ලද සාමාජික මුදල් | 50 | 40 |

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය කොපමණ ද? (ශුද්ධ වත්කම් පදනම යොදා ගන්න.)

(1) රු. 130 000 (2) රු. 170 000 (3) (රු. 40 000) (4) (රු. 170 000) (5) (රු. 130 000) (......)

- **ප්‍රශ්න අංක 13 සහ 14 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ලාභාලාභ 2:1 අනුපාතයට බෙදා ගනිමින් අමල් සහ කමල් විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගිය අතර 2016.04.01 දින විමල් හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදී. ඔහු රු. 500 000 ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කළේ ය. මෙදිනට ඇස්තමේන්තු කරන ලද කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපන ලදී. කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වා ගනු නොලබයි. අමල්, කමල් සහ විමල් හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි එකඟතා පහත පරිදි වේ.

- අමල්, කමල් සහ විමල් පිළිවෙළින් ලාභාලාභ 3:2:1 අනුපාතයට බෙදාගනු ලබයි.
- කමල් රු. 360 000 ක වාර්ෂික වැටුපකට හිමිකම් ලබයි.

පහත තොරතුරු ද දී ඇත:

| | **ප්‍රාග්ධන ගිණුම් (රු.'000) බැර** | | **ජංගම ගිණුම් (රු.'000) බැර** | |
|---|---|---|---|---|
| | **2017.03.31 දිනට** | **2016.03.31 දිනට** | **2017.03.31 දිනට** | **2016.03.31 දිනට** |
| අමල් | 2 200 | 2 000 | 650 | 500 |
| කමල් | 1 000 | 1 000 | 700 | 300 |
| විමල් | 300 | – | 50 | – |

වර්ෂය තුළ දී අමල් සහ කමල් අතිරේක ප්‍රාග්ධනය ලබා දී නොමැත. 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ගැනිලි: අමල් රු. 210 000, කමල් රු. 200 000 සහ විමල් රු. 70 000 ක් වූ අතර ඒවා ජංගම ගිණුම් තුළින් ගළපා ඇත.

**13.** 2016.04.01 දිනට ඇස්තමේන්තුගත කීර්තිනාමය සහ 2017.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ හිමිකම:

| | **කීර්තිනාමය (රු.'000)** | **හිමිකම (රු.'000)** |
|---|---|---|
| (1) | 200 | 3 500 |
| (2) | 200 | 4 900 |
| (3) | 1 000 | 2 100 |
| (4) | 1 200 | 3 500 |
| (5) | 1 200 | 4 900 |

(......)

**14.** 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය සහ කමල්ට බෙදා හරින ලද මුළු ලාභය:

| | **වර්ෂය සඳහා ලාභය (රු.'000)** | **කමල්ට බෙදා හරින ලද මුළු ලාභය (රු.'000)** |
|---|---|---|
| (1) | 600 | 240 |
| (2) | 720 | 240 |
| (3) | 720 | 600 |
| (4) | 1 080 | 240 |
| (5) | 1 080 | 600 |

(......)

**15.** LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතය යටතේ හඳුනාගත් වත්කමක් සම්බන්ධව පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?

(1) එය භාණ්ඩ නිෂ්පාදනය කිරීමට හෝ සේවා සැපයීමට භාවිත කරනු ලබන ස්පෘශ්‍ය හෝ අස්පෘශ්‍ය වත්කමකි.

(2) එය එක් වසරකට වඩා වැඩි කාලයක් භාවිත කිරීමට අපේක්ෂා කෙරේ.

(3) එය හඳුනා ගැනීමේ දී පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය මත පදනම්ව මිනුම් කරයි.

(4) එය හඳුනා ගැනීමෙන් පසු දැරූ සියලු වියදම් සැමවිට ම ප්‍රාග්ධනීත කරයි.

(5) එය වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා නෛතික අයිතිය අත්‍යවශ්‍ය කොන්දේසියක් වේ. (......)

**16.** පහත තොරතුරු 2017.03.31 දින ව්‍යාපාරයක් විසින් අත්පත් කර ගත් යන්ත්‍රයක් හා බැඳේ. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී නොමැත.

| **විස්තරය** | **රු.** |
|---|---|
| 15% ක VAT ඇතුළත්ව ගෙවූ මිල | 230 000 |
| සැපයුම්කරුගේ සමාගමේ සිට ව්‍යාපාරයට ප්‍රවාහන පිරිවැය | 15 000 |
| ස්ථාපිත සහ එකලස් කිරීමේ පිරිවැය | 30 000 |
| පැරණි යන්ත්‍රය ගලවා ඉවත් කිරීමේ පිරිවැය | 2 000 |
| යන්ත්‍රය භාවිතයට ගැනීමට පෙර පරීක්ෂා කිරීමේ පිරිවැය | 8 000 |
| යන්ත්‍රය භාවිත කිරීම සඳහා සේවකයන් පුහුණු කිරීමේ පිරිවැය | 12 000 |

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනා ගැනීමේ දී යන්ත්‍රයේ පිරිවැය කොපමණ ද?

(1) රු. 255 000 (2) රු. 267 000 (3) රු. 283 000 (4) රු. 285 000 (5) රු. 297 000 (......)

[හතරවැනි පිටුව බලන්න.

**17.** පහත තොරතුරු 2017 මාර්තු මාසය සඳහා සමාගමක තොග අයිතමයක් හා බැඳේ.

| **දිනය** | **විස්තරය** | **ප්‍රමාණය (ඒකක)** | **ඒකකයක පිරිවැය (රු.)** |
|---|---|---|---|
| 2017.03.01 | ශේෂය | 100 | 200 |
| 2017.03.20 | ගැනුම් | 400 | 400 |
| 2017.03.27 | විකුණුම් | 200 | ? |

තොග නිකුත් කිරීම් මිල කිරීම සඳහා වර්තමානයේ දී පෙර-පිවිසි පෙර-පිට ක්‍රමය අනුගමනය කරන මෙම සමාගම අනාගතයේ දී භරිත සාමාන්‍ය ක්‍රමය භාවිත කිරීමට සලකා බලමින් සිටී.
2017.03.31 දිනට එක් එක් ක්‍රමය යටතේ තොග පිරිවැය කොපමණ ද?

| | **පෙර-පිවිසි පෙර-පිට (රු.'000)** | **භරිත සාමාන්‍ය (රු.'000)** |
|---|---|---|
| (1) | 100 | 90 |
| (2) | 100 | 108 |
| (3) | 120 | 90 |
| (4) | 120 | 108 |
| (5) | 120 | 180 |

(……)

**18.** 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත දිමුතු පොදු සමාගමේ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතයක් පහත දී ඇත.

| | **රු.'000** |
|---|---|
| අයභාරය | 8 000 |
| විකුණුම් පිරිවැය | 2 000 |
| මෙහෙයුම් වියදම් (රු. 1 000 000 ක ක්ෂය ද ඇතුළුව) | 3 000 |

පහත තොරතුරු සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගෙන ඇත.

| | **2017.03.31 දිනට (රු.'000)** | **2016.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 400 | 200 |
| තොග | 900 | 600 |

සමාගම මුදල් පදනම මත පමණක් භාණ්ඩ විකුණනු ලබන අතර බදු ගෙවීමෙන් නිදහස් කළ කාලයක් තුළ ක්‍රියාත්මක වේ.
2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

(1) රු. 2 900 000 (2) රු. 3 000 000 (3) රු. 3 900 000 (4) රු. 4 000 000 (5) රු. 4 100 000 (……)

**19.** LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව ප්‍රතිපාදනයක් හඳුනා ගැනීමේ දී පහත කුමන කොන්දේසිය/කොන්දේසි සපුරාලිය යුතු ද?

A - අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඒකකයක වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳීමක් තිබීම
B - බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් ගලායාමේ හව්‍යතාවයක් තිබීම
C - බැඳීමේ වටිනාකම විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කිරීමට හැකි වීම

(1) A පමණි. (2) C පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම ය. (……)

**20.** සීමිත අමිල පොදු සමාගමේ 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂවරු විසින් 2017.06.30 දින අනුමත කරන ලදී. 2017.03.31 දින සිට 2017.06.30 දින දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමේ සිදු විය.

A - 2017.05.01 දින සිට සමාගමේ ආයෝජනයක වෙළෙඳපොළ වටිනාකම අඛණ්ඩව පහත වැටීම
B - 2017.03.01 දින ණයට භාණ්ඩ මිල දී ගත් ණයගැතියකු 2017.05.19 දින බුන්වත් වූ බව උසාවිය විසින් ප්‍රකාශ කිරීම
C - 2017.05.30 දින ඇති වූ ගින්නක් හේතුවෙන් 2017.03.31 දින සිට පැවති තොගය විනාශ වීම
D - 2017.03.31 දිනට ව්‍යාපාරය සතු වූ ඉඩමක් පාරක් ඉදි කිරීම සඳහා අත්පත් කර ගන්නා බව දන්වමින් 2017.06.20 දින රජයෙන් ලිපියක් ලැබීම

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඉහත කුමන සිදුවීම් **නොගළපන සිද්ධීන්** ලෙස සලකනු ලබයි ද?

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ල ම ය. (……)

**21.** පහත දී ඇති තොරතුරු සීමිත ලංකා පොදු සමාගම හා බැඳේ.

| **විස්තරය** | **2017.03.31 දිනට (රු.'000)** | **2016.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 5 000 | 4 600 |
| රඳවාගත් ඉපැයුම් | 1 500 | 900 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 1 000 | – |
| **එකතුව** | **7 500** | **5 500** |

2017.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී රු. 200 000 ක අතුරු ලාභාංශයක් ගෙවන ලද අතර 2017.04.15 දින රු. 300 000 ක අවසන් ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලදී. 2017.03.31 දින දේපළ, පිරියත සහ උපකරණ ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලදී.
2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ මුළු විස්තීරණ ආදායම කොපමණ ද?

| | **ලාභය (රු.'000)** | **මුළු විස්තීරණ ආදායම (රු.'000)** |
|---|---|---|
| (1) | 600 | 1 000 |
| (2) | 600 | 1 600 |
| (3) | 800 | 1 000 |
| (4) | 800 | 1 800 |
| (5) | 1 100 | 2 100 |

(……)

[ පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**22.** පහත තොරතුරු නිෂ්පාදන සමාගමකට අදාළ වේ.

| **2017.03.31 දිනට:** | | **2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | |
|---|---|---|---|
| ජංගම අනුපාතය | 2:1 | විකුණුම් | රු. 600 000 |
| ජංගම වගකීම් | රු. 300 000 | දළ ලාභ අනුපාතය | 25% |
| තොග | රු. 120 000 | | |

2016.04.01 දිනට තොග රු. 180 000 ක් විය.
සමාගමේ ක්ෂණික අනුපාතය සහ තොග පිරිවැටුම් අනුපාතය කොපමණ ද?

| | **ක්ෂණික අනුපාතය (වාර)** | **තොග පිරිවැටුම් අනුපාතය (වාර)** |
|---|---|---|
| (1) | 0.4 | 3.75 |
| (2) | 0.625 | 3 |
| (3) | 0.625 | 4 |
| (4) | 1.6 | 3 |
| (5) | 1.6 | 4 |

(......)

**23.** 2017.03.31 දිනට සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක ජංගම අනුපාතය 2:1 ක් විය. අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී මෙම අනුපාතය **අඩුවීමට** බලපාන්නේ පහත කුමන ගනුදෙනුව ද?
(1) භාණ්ඩ විකුණුමක් සඳහා අත්තිකාරමක් ලැබීම
(2) ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ ණයට විකිණීම
(3) කලින් ණයට ගත් භාණ්ඩ ආපසු යැවීම
(4) මෝටර් රථයක් මුදලට විකිණීම
(5) බැංකුවකින් දිගුකාලීන ණයක් ලබා ගැනීම (......)

**24.** පහත කුමන කාර්යයන් ආයතනයක කළමනාකරණ ගිණුම්කරණයේ දී සිදු කරනු ලබයි ද?
A - වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම
B - තීරණ ගැනීම සඳහා කාර්යයක පිරිවැය, ස්ථාවර සහ විචල්‍ය ලෙස විශ්ලේෂණය කිරීම
C - ප්‍රසිද්ධ කිරීම සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම
D - ව්‍යාපෘතියක් ඇගයීම සඳහා මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම
(1) A හා C පමණි.
(2) B හා D පමණි.
(3) A, B හා D පමණි.
(4) A, C හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම ය. (......)

**25.** පහත කුමන පිරිවැය වර්ගීකරණය, පිරිවැය-පරිමා-ලාභ (CVP) විශ්ලේෂණය සඳහා **වඩාත්** උචිත වේ ද?
(1) සෘජු පිරිවැය සහ වක්‍ර පිරිවැය
(2) අදාළ නොවන පිරිවැය සහ ආවස්ථික පිරිවැය
(3) අදාළ පිරිවැය සහ අදාළ නොවන පිරිවැය
(4) අදාළ පිරිවැය සහ ගිලුණු පිරිවැය
(5) විචල්‍ය පිරිවැය සහ ස්ථාවර පිරිවැය (......)

**26.** පහත අයවැයගත තොරතුරු තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක යන්ත්‍ර හා නිමැවුම් අංශවලට අදාළ වේ.

| | **යන්ත්‍ර අංශය** | **නිමැවුම් අංශය** |
|---|---|---|
| ඒකකයක් නිෂ්පාදනය සඳහා ගත කළ කාලය | යන්ත්‍ර පැය 6 | ශ්‍රම පැය 8 |
| පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය | යන්ත්‍ර පැයකට රු. 30 | ශ්‍රම පැයකට රු. 40 |

ඒකකයක අයවැයගත නිෂ්පාදන පිරිවැය රු. 800 කි. භාණ්ඩ ඒකකයක අයවැයගත ප්‍රාථමික පිරිවැය කොපමණ ද?
(1) රු. 300 (2) රු. 480 (3) රු. 500 (4) රු. 620 (5) රු. 730 (......)

**27.** ඇඟළුම් නිෂ්පාදන ආයතනයක යන්ත්‍ර ක්‍රියාකරුවන්ට අදාළ පහත කුමන අයිතම සෘජු වේතන ලෙස සලකනු ලබයි ද?
A - සාමාන්‍ය වැඩ කරන පැය සඳහා මූලික ගෙවීම
B - නිෂ්පාදන ඒකක මත දිරි දීමනාව
C - විශේෂ ඇණවුමක් සඳහා අතිකාල දීමනාව
D - රෝහල්ගත කිරීමක දී ගෙවන වෛද්‍ය දීමනාව
(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) A හා D පමණි.
(4) A, B හා C පමණි.
(5) B, C හා D පමණි. (......)

**28.** නිෂ්පාදන සමාගමක් අමුද්‍රව්‍ය මිල දී ගැනීමේ දී ආර්ථික ඇණවුම් ප්‍රමාණය, යළි ඇණවුම් ප්‍රමාණය ලෙස යොදා ගනී. පහත තොරතුරු අමුද්‍රව්‍ය අයිතමයක් හා බැඳේ.

| | | |
|---|---|---|
| ඇණවුම් පිරිවැය | ඇණවුමක් සඳහා | රු. 750 |
| රඳවා ගැනීමේ පිරිවැය | ඒකකයක් සඳහා වර්ෂයකට | රු. 10 |
| මාසික ඉල්ලුම | ඒකක | 5 000 |

අමුද්‍රව්‍යයෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණය සහ වාර්ෂික ඇණවුම් පිරිවැය වනුයේ:

| | **ආර්ථික ඇණවුම් ප්‍රමාණය (ඒකක)** | **වාර්ෂික ඇණවුම් පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 1 000 | 45 000 |
| (2) | 2 000 | 22 500 |
| (3) | 3 000 | 15 000 |
| (4) | 4 000 | 11 250 |
| (5) | 5 000 | 9 000 |

(......)

**29.** පහත තොරතුරු සමාගමක් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාළ වේ.
ඒකකයක විචල්‍ය පිරිවැය රු. 150 දායක විකුණුම් අනුපාතය 40%
ඒකකයක විචල්‍ය පිරිවැය නොවෙනස්ව තිබිය දී එහි විකුණුම් මිල වැඩි කිරීමෙන් දායක විකුණුම් අනුපාතය 60% දක්වා වැඩි කිරීමට සමාගම බලාපොරොත්තු වේ. භාණ්ඩයේ නව විකුණුම් මිල කොපමණ වේ ද?
(1) රු. 210 (2) රු. 240 (3) රු. 250 (4) රු. 275 (5) රු. 375 (......)

**30.** වසර 5 ක කාලය සඳහා වන ව්‍යාපෘතියකට යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා රු. 5 000 000 ක ආයෝජනයක් අවශ්‍ය වේ. ව්‍යාපෘතිය අවසානයේ එහි සුන්බුන් අගය රු. 1 000 000 ක් වේ. ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (ARR) 20% ක් නම්, ව්‍යාපෘතියේ සාමාන්‍ය වාර්ෂික ලාභය කොපමණ ද? (සාමාන්‍ය වාර්ෂික ලාභය, සාමාන්‍ය ආයෝජනයෙන් බෙදීමෙන් ARR ගණනය කර ඇත. තව ද මෙම ව්‍යාපෘතියෙන් සෑම වසරක ම සමාන ලාභයක් උපයන බව උපකල්පනය කරන්න.)
(1) රු. 500 000 (2) රු. 600 000 (3) රු. 800 000 (4) රු. 1 000 000 (5) රු. 1 200 000 (......)

[ශයවැනි පිටුව බලන්න.

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

**31.** පහත සඳහන් දෑ ආයතනයක පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල උපාංග ලෙස සලකනු ලබයි ද යන්න සඳහන් කරන්න.

| | **ඔව්/නැත** | | **ඔව්/නැත** |
|---|---|---|---|
| A - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | :.................. | B - මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් | :.................. |
| C - අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | :.................. | D - හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | :.................. |

**32.** පහත ගනුදෙනු වාර්තා කිරීමට භාවිත කරන මූලික සටහන් පොත් සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **මූලික සටහන් පොත** |
|---|---|
| A - ණය පදනම මත භාණ්ඩ විකිණීම | :............................. |
| B - ණයගැතියකුගෙන් චෙක්පතක් ලැබීම | :............................. |
| C - ණයගැතියකුගෙන් ලද චෙක්පතක් අගරු වීම | :............................. |
| D - ණයගැති ශේෂයක් බොල් ණයක් ලෙස කපා හැරීම | :............................. |

**33.** පහත ගනුදෙනු පොදු ලෙජරයෙහි පිටපත් කරනු ලබන ගිණුම් සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **හර** | **බැර** |
|---|---|---|
| A - ණය පදනම මත භාණ්ඩ විකිණීම | :............................. | ............................. |
| B - ණයගැති ශේෂයක් බොල් ණයක් ලෙස කපා හැරීම | :............................. | ............................. |

**34.** පොදු ලෙජරයේ පවත්වාගනු ලබන පහත ගිණුම්වල නිවැරදි වර්ගීකරණය සඳහන් කරන්න.

| **ගිණුම** | **වර්ගීකරණය** | **ගිණුම** | **වර්ගීකරණය** |
|---|---|---|---|
| A - ක්ෂය | :........................... | B - ප්‍රත්‍යාගණන සංචිත | :........................ |
| C - වෙළෙඳ ගෙවිය යුතු දෑ | :........................... | D - ලද වට්ටම් | :........................ |

**35.** ව්‍යාපාරයක පහත ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** [(+) හෝ (–) ලකුණ සහිතව අගයන්] ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපණය කරන්නේ කෙසේ ද යන්න දක්වන්න.

| **ගනුදෙනුව** | **වත්කම් (රු.)** | = | **වගකීම් (රු.)** | + | **හිමිකම් (රු.)** |
|---|---|---|---|---|---|
| A - රු. 150 000 ක තොග ණයට මිල දී ගැනීම | :................ | | ................ | | ................ |
| B - රු. 90 000 ක් පිරිවැය වූ තොග රු. 140 000 කට අත්පිට මුදලට විකිණීම | :................ | | ................ | | ................ |

**36.** සුමුදු රු. 800 000 ක් මුදලින් ආයෝජනය කරමින් 2017.03.01 දින සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. 2017.03.31 දිනෙන් අවසන් මාසය තුළ දී රු. 350 000 ක් පිරිවැය වූ භාණ්ඩ ණයට මිල දී ගත් අතර ඒවා රු. 400 000 ක අත්පිට මුදලට විකුණන ලදී. තව ද ව්‍යාපාරය රු. 60 000 ක වියදමක් මාසය සඳහා දරණ ලද අතර එයින් රු. 20 000 ක් 2017.03.31 දිනට ගෙවිය යුතු විය. 2017.03.31 දිනට පහත දෑ සඳහන් කරන්න.

(අ) වත්කම් (රු.) :.....................  (ආ) වගකීම් (රු.) :.....................  (ඉ) හිමිකම් (රු.) :.....................

**37.** පහත සඳහන් එක් එක් අවස්ථාවේ දී **වඩාත්** හොඳින් අදාළ වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?

(1) ඒකක  (2) විචක්ෂණ  (3) අඛණ්ඩ පැවැත්ම  (4) කාලච්ඡේද

| **අවස්ථාව** | **ගිණුම්කරණ සංකල්පය** |
|---|---|
| A - මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන කාලය දැක්වීම | :............................. |
| B - අයිතිකරුවන්ට කරන ලද බෙදා හැරීම් රඳවාගත් ඉපැයීම්වලින් අඩු කිරීම | :............................. |
| C - දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගත් පිරිවැයට මැනීම | :............................. |
| D - පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් අඩු වටිනාකමට තොග මැනීම | :............................. |

**38.** සමාගමක පහත සඳහන් එක් එක් අවස්ථාවේ දී පවත්වා ගැනීමට අපේක්ෂා කරනු ලබන ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගතිලක්ෂණය සඳහන් කරන්න.

| **අවස්ථාව** | **ගුණාත්මක ගතිලක්ෂණය** |
|---|---|
| A - දේපළ, පිරියත සහ උපකරණ සාධාරණ අගයට ප්‍රත්‍යාගණනය කිරීම | :................................... |
| B - කර්මාන්ත සම්මතයන්ට අනුකූල වන පරිදි තොග පෙර-පිවිසි-පෙර-පිට ක්‍රමයට අගය කිරීම | :................................... |
| C - මූල්‍ය කල්බද්දක් මත මිල දී ගත් මෝටර් රථයක් වත්කමක් ලෙස හඳුනා ගැනීම | :................................... |
| D - සෑම කාර්තුවක් අවසානයෙන් සතියක් තුළ දී අතුරු මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම | :................................... |

**39.** පහත තොරතුරු ක්‍රීඩා සමාජයක සාමාජික මුදල් හා බැඳේ:

| **විස්තරය** | **2017.03.31 දිනට (රු.)** | **2016.03.31 දිනට (රු.)** |
|---|---|---|
| කලින් ලද සාමාජික මුදල් | 80 000 | 60 000 |
| හිඟ සාමාජික මුදල් | 30 000 | 20 000 |

සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1 000 කි. 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සාමාජිකයින් 60 දෙනකු විය. 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න:

(අ) ආදායම ලෙස හඳුනාගත් සාමාජික මුදල් රු. .....................  (ආ) මුදලින් ලද සාමාජික මුදල් රු. .....................

[හත්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228  WWW.PADANAMAPUBLICATION.LK

**40.** හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**41.** හවුල් ව්‍යාපාරයකට අදාළ ව පහත ප්‍රකාශ **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **(F)** යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **T/F** |
|---|---|
| A - හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබනුයේ එහි ලාභදායිත්වය වෙනස් වන විට දී ය. | ............ |
| B - සමාගම් පනතට (2007) අනුව හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව 20 කි. | ............ |
| C - හවුල්කරුවන් අතර ලිඛිත ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පැවතිය නොහැකි ය. | ............ |
| D - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත 5% ක පොලියක් ගෙවිය යුතු වේ. | ............ |

**42.** 2017.03.01 දින සමාගමක් කොටසක් රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 10 000 ක් සඳහා අයදුම්පත් කැඳවන ලදී. කොටස් 15 000 ක් සඳහා අයදුම්පත් ලැබුණු අතර 2017.03.31 දින එම කොටස් සමානුපාතිකව විභජනය කරන ලදී. අතිරික්ත මුදල් අයදුම්කරුවන්ට ආපසු යවන ලදී. පහත දෑ ගණනය කරන්න.

(අ) 2017.03.31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩි වීම රු. ........................

(ආ) ආපසු යවන ලද අතිරික්ත මුදල රු. ........................

**43.** 2016.04.01 දිනට සමාගමක ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය කොටසක් රු. 50 බැගින් නිකුත් කළ කොටස් 100 000 කින් සමන්විත විය. මෙදින කොටසක් රු. 40 බැගින් සමාගම එහි සංචිතවලින් රු. 1 000 000 ක් ප්‍රාග්ධනිත කරන ලදී. තව ද 2017.03.31 දින පැවති සෑම කොටස් පහකට එක බැගින් වන අනුපාතයකට කොටසක් රු. 30 බැගින් හිමිකම් නිකුතුවක් කරන ලදී. දැනට සිටින කොටස්කරුවන් විසින් සියලු හිමිකම්වලට දායක විය. පහත දෑ ගණනය කරන්න.

(අ) 2017.03.31 දිනට හිමිකමේ වැඩි වීම රු. ........................

(ආ) හිමිකම් නිකුතුවෙන් ලද මුදල රු. ........................

**44.** 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ උද්ධෘතයක් පහත දී ඇත.

**(රු.'000)**

| **විස්තරය** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය – සාමාන්‍ය කොටස්** | **ප්‍රත්‍යාගණන සංචිත** | **රඳවාගත් ඉපැයීම්** | **එකතුව** |
|---|---|---|---|---|
| 2016.04.01 දිනට ශේෂය | 1 000 | 500 | 200 | 1 700 |
| A | – | 800 | 700 | 1 500 |
| B | 500 | – | (500) | – |
| C | – | – | (100) | (100) |
| D | 600 | – | – | 600 |
| 2017.03.31 දිනට ශේෂය | **2 100** | **1 300** | **300** | **3 700** |

ඉහත වගුවෙහි A , B, C සහ D ලෙස දක්වා ඇති අයිතම හඳුනාගන්න.

A - ..........................................................................................

B - ..........................................................................................

C - ..........................................................................................

D - ..........................................................................................

**45.** පහත සඳහන් තොරතුරු නිෂ්පාදන සමාගම් දෙකක 2017.03.31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අදාළ වේ.

| **අනුපාතය** | **සීමිත R පොදු සමාගම** | **සීමිත Q පොදු සමාගම** |
|---|---|---|
| ණය හිමිකම් (වාර) | 1.5 | 0.8 |
| පොලී ආවරණ (වාර) | 2.5 | 3.2 |
| හිමිකම් මත ප්‍රතිලාභ | 25% | 20% |
| ක්ෂණික වත්කම් | 0.8 : 1 | 1.2 : 1 |

මෙම සමාගම්වලට අදාළ ව පහත දෑ සඳහන් කරන්න.

A - කොටස් හිමියන්ට වැඩි ප්‍රතිලාභයක් ජනනය කරන සමාගම ........................

B - පොලී වියදම් ආවරණය කිරීමට ඉහළ හැකියාවක් ඇති සමාගම ........................

C - වත්කම් අත්පත් කරගැනීම සඳහා වැඩි ණය ප්‍රාග්ධනයක් භාවිත කරන සමාගම ........................

D - කෙටිකාලීන බැඳීම් පියවීමට වැඩි හැකියාවක් ඇති සමාගම ........................

[අටවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**46.** වෙනත් සාධක ස්ථාවරව තිබිය දී 2017.03.31 දිනට පහත එක් එක් ගනුදෙනුවේ දී සමාගමක හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සහ ණය හිමිකම් අනුපාතය **වැඩි වේ (I)** ද, **අඩු වේ (D)** ද හෝ **වෙනස් නොවේ (NC)** ද යන්න සඳහන් කරන්න. (මෙම ගනුදෙනු 2017.03.31 දින සිදු වූ බව උපකල්පනය කරන්න.)

| **ගනුදෙනුව** | **හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය** | **ණය හිමිකම් අනුපාතය** |
|---|---|---|
| A - 12% ක පොලී අනුපාතයකට බැංකුවකින් දිගුකාලීන ණයක් ලබාගැනීම | ............... | ............... |
| B - හිමිකම් නිකුතුවක් කළ අතර දැනට සිටින කොටස්කරුවන් සියලු ම හිමිකම් සඳහා දායක විය | ............... | ............... |

**47.** යන්ත්‍ර සහ එකලස් යන පිරිවැය මධ්‍යස්ථාන දෙක තුළින් තනි භාණ්ඩයක් නිපදවනු ලබන ආයතනයකට පහත තොරතුරු අදාළ වේ.

| **විස්තරය** | **යන්ත්‍ර දෙපාර්තමේන්තුව** | **එකලස් දෙපාර්තමේන්තුව** |
|---|---|---|
| ඒකකයකට අන්තර්ග්‍රහණය කරන ලද පොදු කාර්ය පිරිවැය | රු. 300 | රු. 100 |
| ඒකකයක් නිපදවීම සඳහා පැය ගණන | යන්ත්‍ර පැය 3 | ශ්‍රම පැය 2 |
| වැඩ කරන ලද මුළු පැය ගණන | යන්ත්‍ර පැය 5 000 | ශ්‍රම පැය 6 000 |

යන්ත්‍ර දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මත ද, එකලස් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය මත ද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.

පහත දෑ ගණනය කරන්න.

| | **යන්ත්‍ර දෙපාර්තමේන්තුව** | **එකලස් දෙපාර්තමේන්තුව** |
|---|---|---|
| (අ) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය (පැයකට රු.) | ............... | ............... |
| (ආ) අන්තර්ග්‍රහණය කරන ලද මුළු පොදු කාර්ය පිරිවැය (රු.) | ............... | ............... |

**48.** තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන ආයතනයක වාර්ෂික අයවැයගත තොරතුරු පහත දී ඇත. මෙම ආයතනයේ ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අයවැයගත ක්‍රියාකාරී මට්ටම ඒකක 10 000 කි.

| | |
|---|---|
| ඒකකයක විකුණුම් මිල | රු. 100 |
| ඒකකයක ප්‍රාථමික පිරිවැය (සියල්ල විචල්‍ය පිරිවැය වේ.) | රු. 20 |
| ඒකකයක විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 15 |
| විකුණුම් නියෝජිත කොමිස් | විකුණුම් මිලෙන් 5% |
| ඒකකයක ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 12 |
| ඒකකයක ස්ථාවර නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය | රු. 18 |

පහත දෑ ගණනය කරන්න.

(අ) ඒකක 10 000 ක ක්‍රියාකාරී මට්ටමේ දී:


(1) ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. .....................

(2) ඒකකයක මුළු පිරිවැය රු. .....................

(3) ඒකකයක විචල්‍ය පිරිවැය රු. .....................

(ආ) ඒකක 6 000 ක ක්‍රියාකාරී මට්ටමක දී ඒකකයක ස්ථාවර පිරිවැය රු. .....................

**49.** සමාගමක ලාභ-පරිමා ප්‍රස්තාරය පහත දී ඇත. මෙම ප්‍රස්තාරයෙහි A, B සහ C තුළින් දක්වා ඇති අයිතම හඳුනාගන්න.




A - ........................................

B - ........................................

C - ........................................

**50.** නිෂ්පාදන සමාගමක් පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලට ගැනීමට සලකා බලමින් සිටී. මෙයට අදාළ ශක්‍යතා අධ්‍යයනය පැවැත්වීමට දරණ ලද පිරිවැය රු. 50 000 කි. මෙම මිල දී ගැනීමට අදාළ ව පහත ඇස්තමේන්තු පිළියෙල කර ඇත.

| | |
|---|---|
| නව යන්ත්‍රයේ පිරිවැය | රු. 1 000 000 |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් ආදායම | රු. 300 000 |
| අතිරේක කාරක ප්‍රාග්ධනය | රු. 200 000 |
| ආයෝජනයේ පිළිගෙවුම් කාලය | වසර 3 |
| නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය | වසර 4 |

ශුද්ධ මෙහෙයුම් මුදල් ගලාඒම් සෑම වසරක ම සමාන වේ යැයි උපකල්පනය කරන්න.

පහත දෑ ගණනය කරන්න.

(අ) මූලික මුදල් ගලායාම රු. .......................

(ආ) අපේක්ෂිත වාර්ෂික ශුද්ධ මෙහෙයුම් මුදල් ගලාඒම රු. .......................

* * *

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2017 අගෝස්තු

## 33 - ගිණුම්කරණය I

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1. | 5 |
| 2. | 5 |
| 3. | 1 - 3 |
| 4. | 1 |
| 5. | 2 |
| 6. | 3 |
| 7. | 1 |
| 8. | 3 |
| 9. | 5 |
| 10. | 5 |
| 11. | 5 |
| 12. | 1 |
| 13. | 5 |
| 14. | 5 |
| 15. | 2 |
| 16. | 4 - 3 |
| 17. | 4 |
| 18. | 3 |
| 19. | 5 |
| 20 | 3 |
| 21. | 4 |
| 22. | 4 |
| 23. | 1 |
| 24. | 3 |
| 25. | 5 |
| 26. | 1 |
| 27. | 4 |
| 28. | 3 |
| 29. | 5 |
| 30. | 2 |

*(1 සිට 30 දක්වා එක් පිළිතුරකට ලකුණු 04 බැගින් ලකුණු 120 යි)*

31. A - ඔව් (01) B - ඔව් (01)
C - නැත (01) D - ඔව් (01)

32. A - විකුණුම් ජර්නලය (01)
B - ලැබීම් මුදල් ජර්නලය (01)
C - පොදු ජර්නලය (01)
D - පොදු ජර්නලය (01)

33.

| | හර | බැර | |
|---|---|---|---|
| A - | ණයගැති පාලන ගිණුම | විකුණුම් ගිණුම | (02) |
| B - | බොල් ණය ගිණුම | ණයගැති පාලන ගිණුම | (02) |

34. A - වියදම් (01) B - හිමිකම් (01)
C - වගකීම් (01) D - ආදායම් (01)

35.

| | වත්කම් (රු.) | = | වගකීම් (රු.) | + | හිමිකම් (රු.) | |
|---|---|---|---|---|---|---|
| A - | + 150 000 | = | + 150 000 | | | (02) |
| B - | + 50 000 | = | | + | 50 000 | (02) |

36. (අ) වත්කම් (රු.) 1160 000 (02) (ආ) වගකීම් (රු.) 370 000 (01) (ඉ) හිමිකම් (රු.) 790 000 (01)

37. A - කාලච්ඡේද / (4) (01)
B - ඒකක / (1) (01)
C - අඛණ්ඩ පැවැත්ම / (3) (01)
D - විචක්ෂණ / (2) (01)

38. A - අදාල බව (01)
B - සැසඳිය හැකි බව (01)
C - විශ්වසනීය නියෝජනය (01)
D - කාලීන බව (01)

39. (අ) රු.60 000 (02) (ආ) රු.70 000 (02)

40. 1. නව හවුල්කරුවකු හවුල් ව්‍යාපාරයට බඳවා ගැනීම (02)
2. සිටින හවුල්කරුවකු හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වීම (02)

41. A F (01)
B T (01)
C - F (01)
D - F (01)

42. (අ) රු.200 000 (02)
(ආ) රු.100 000 (02)

43. (අ) රු.750 000 (02)
(ආ) රු.750 000 (02)

44. A - මුළු විස්තීරණ ආදායම (01)
B - සංචිත ප්‍රාග්ධනිත කිරීම (01)
C - අතුරු ලාභාංශ ගෙවීම (01)
D - හිමිකම් / නව කොටස් නිකුතුව (01)

45. A - R PLC (01)
B - Q PLC (01)
C - R PLC (01)
D - Q PLC (01)

46.

| | හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | | ණය හිමිකම් අනුපාතය | |
|---|---|---|---|---|
| A - | NC | (01) | I | (01) |
| B - | D | (01) | D | (01) |

47.

| | යන්ත්‍ර දෙපාර්තමේන්තුව | | එකලස් දෙපාර්තමේන්තුව | |
|---|---|---|---|---|
| (අ) | රු.100 | (01) | රු.50 | (01) |
| (ආ) | රු.500 000 | (01) | රු. 300 000 | (01) |

48. (අ) 1 රු. 47 (01)
2 රු. 70 (01)
3 රු. 40 (01)

(ආ) රු. 50 (01)

49. A - අලාභය (01)
B - සමච්ඡේදන ලක්ෂය (02)
C - ලාභය (01)

50. (අ) රු.1 200 000 (02)
(ආ) රු.300 000 (02)

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්

සිංහල මාධ්‍ය

**විද්‍යා - ගණිත**

- 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- 12-13 රසායන විද්‍යාව - 1
- 12-13 රසායන විද්‍යාව - 2
- 12-13 රසායන විද්‍යාව - 3
- 12-13 රසායන විද්‍යාව - 4
- 12-13 රසායන විද්‍යාව - 5
- 12-13 භෞතික විද්‍යාව - 1
- 12-13 භෞතික විද්‍යාව - 2
- 12-13 භෞතික විද්‍යාව - 3
- 12-13 භෞතික විද්‍යාව - 4
- 12-13 භෞතික විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 1
- 12-13 ජීව විද්‍යාව - 2
- 12-13 ජීව විද්‍යාව - 3
- 12-13 ජීව විද්‍යාව - 4
- 12-13 ජීව විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- 12-13 කෘෂි විද්‍යාව - 1
- 12-13 කෘෂි විද්‍යාව - 2
- 12-13 කෘෂි විද්‍යාව - 3
- 12-13 කෘෂි විද්‍යාව - 4

**වාණිජ්‍යය**

- 12 ගිණුම්කරණය
- 13 ගිණුම්කරණය
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 13 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව
- 13 ආර්ථික විද්‍යාව - 1
- 13 ආර්ථික විද්‍යාව - 2

**කලා**

- 12 සිංහල
- 13 සිංහල
- 12 දේශපාලන විද්‍යාව
- 13 දේශපාලන විද්‍යාව
- 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- 12 ඉන්දියානු ඉතිහාසය
- 13 ඉන්දියානු ඉතිහාසය
- 12 භූගෝල විද්‍යාව
- 13 භූගෝල විද්‍යාව
- 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes

English Medium

- 12 Accounting
- 13 Accounting
- 12 Business Studies
- 13 Business Studies
- 12 Economics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර

සිංහල මාධ්‍ය

- සාමාන්‍ය දැනීම
- 12 ගිණුම්කරණය - 1
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.